රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක. PF/429

මගේ අංකය: PUB/FIN/T/02/10
රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01.
2008.03.17

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
රාජ්‍ය සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩල/ රජය සතු සමාගම් වල සභාපතිවරුන් හා
පළාත් පාලන ආයතන ප්‍රධානීන්

**ජාතික ප්‍රසම්පාදන නියෝජ්තායතනය වසා දැමීම හා ප්‍රසම්පාදන කටයුතු රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත පැවරීම.**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අංක 33 දරණ ව්‍යවස්ථාව යටතේ 2004.07.08 දින නිකුත් කළ ජනාධිපති විධානය පරිදි පිහිටුවන ලදුව 2004 ජුලි මස සිට ක්‍රියාත්මක වූ ජාතික ප්‍රසම්පාදන නියෝජ්තායතනය ඊට පවරන ලද කටයුතු අවසන් කර ඇති බැවින් 2008 මාර්තු 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි එම ආයතනය වසා දැමීමටත්, එම ආයතනය විසින් මෙතෙක් ඉටු කරන ලද කටයුතු පෙර පරිදි රාජ්‍ය මූල්‍ය කළමනාකාරත්වය භාර අමාත්‍යාංශය වන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත පැවරීමටත් තීරණය කර ඇත.

ජාතික ප්‍රසම්පාදන නියෝජ්තායතනය විසින් කළ යුතු බවට නියම කර ඇති හා අඛණ්ඩව කරගෙන යා යුතු සියළුම කටයුතු 2008 මාර්තු01 දින සිට රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් වරයා විසින් ඉටු කරනු ලැබේ.

ජාතික ප්‍රසම්පාදන නියෝජ්තායතනය විසින් ඉටු කරන ලද කාර්යයන් හා ඊට අදාලව ඉදිරියට කර ගෙන යා යුතු කටයුතු මෙන්ම ජාතික ප්‍රසම්පාදන නියෝජ්තායතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ හා පරිපූරක චක්‍රලේඛ උපදෙස් පරිදි ජාතික ප්‍රසම්පාදන නියෝජ්තායතනය විසින් ඉටු කළ යුතු කටයුතු සඳහා රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් අමතන ලෙස දන්වා සිටින අතර අදාළ ලිපිලේඛන රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ පහත ලිපිනයෙහි ස්ථාපිත ප්‍රසම්පාදන අංශය වෙත යොමු කරන මෙන් ද කාරුණිකව දන්වමි.

රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව
ප්‍රසම්පාදන අංශය
22 මහල, බටහිර කුළුණ
ලෝක වෙළඳ මධ්‍යස්ථානය
කොළඹ 01.

එම කාර්යාලයේ දුරකථන අංක 011 2346385-8 සහ ෆැක්ස් අංක 011 2346383-4 වේ.

ප්‍රසම්පාදන මාර්ගෝපදේශ පිළිබඳ විස්තර info@npa.gov.lk විද්‍යුත් තැපැල් ලිපිනය මඟින් සහ www.npa.gov.lk වෙබ් අඩවියෙන් ලබා ගත හැක.

පී.බී. ජයසුන්දර
භාණ්ඩාගාර ලේකම්

පිටපත: 1. ජනාධිපති ලේකම්
2. විගණකාධිපති